ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2091/49 – 2018 ඔක්තෝබර් 03 වැනි බදාදා – 2018.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2017/110.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශවයක් වශයෙන් :*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන් :*

සිලෝන් හොලිඩේ රිසෝට්ස් ලිමිටඩ්, බෙන්තොට බීච් බයි සිනමන්, ගාලු පාර, බෙන්තොට.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

මහනුවර, හෙද පුහුණු විදුහල, විදුහල්පති නිල නිවස, එල්. ආර්. සුමතිපාල මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2017/110.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන් :*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන් :*

සිලෝන් හොලිඩේ රිසෝට්ස් ලිමිටඩ්, බෙන්තොට බීච් බයි සිනමන්, ගාලු පාර, බෙන්තොට.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''බෙන්තොට පිහිටි සිලෝන් හොලිඩේ රිසෝට්ස් ලිමිටඩ් ආයතනයේ නඩත්තු කටයුතු හේතුවෙන් සේවකයින්ගේ කැමැත්තකින් තොරව වෙනත් නෛතික සමාගම්වලට මාරු කිරීම නිසා සේවකයින්ට යම් අසාධාරණයක් සිදුව තිබේද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට කුමන සහනයක් හිමිවිය යුතුද? යන්නත් පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

10-923

---

මගේ අංකය: IR/COM/04/2018/04.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව,

*එක් පාර්ශවයක් වශයෙන් :*

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02.
(දිල්කුෂා ද සිල්වා මිය වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන් :*

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය, කටුබැද්ද, මොරටුව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරණ පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128, එස්. විරිතමුල්ල මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2018/04.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන් :*

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02.
(දිල්කුෂා ද සිල්වා මිය වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන් :*

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය, කටුබැද්ද, මොරටුව.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ රහස්‍ය ලේකම් MM1 - 1 (ii) තනතුර දරන දිල්කුෂා ද සිල්වා මහත්මියට MM1 - 1 (i ශ්‍රේණියට) අදාළ උසස්වීම ලබා නොදීමෙන් අගතියක් සිදුවී ඇත් ද? එසේ නම් ඇයට ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

10-924

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.